# දේවාලයේ බල්ටි ගසන්නට කබ්බන් ෆෝම් කිරම

**සන්නස 2018 දෙසැම්බර් කලාපයේ පළ වූ දහ අට වංගුව ලිපිය සම්බන්ධව දෙසැම්බර් 26 වෙනි දින ඔබ හා කළ දුරකථන සංවාදය හා බැඳේ.**

සන්නස 2018 දෙසැම්බර් කලාපයේ "මයික් ටයිසන්ලා" යනුවෙන් පළ වූ සටහන අප හා සම්බන්ධ පුවතක් බව අපගේ බලවත් විශ්වාසය යි. නමුත් ඔබ හා කළ දුරකතන සංවාදයට අනුව

1. එම සටහන අප ගැන නොවිය හැකිය.
2. එබැවින් මා ඒ ගැන කලබල විය යුතු නැත.
3. වෙනත් කෙනෙකු ගැන විය හැකිය. (ඔබ කියූ අනෙක් නම මා මෙහි දැක්වීමෙන් වැළකී සිටිමි)

මේ සියලු කරුණු අනුව පෙනී යන්නේ එම සටහන පුවත්පතේ පළ කිරීමට පෙර, එම පුවත පිළිබඳ කරුණු (අවස්ථාව, ස්ථානය, සනාථ කරන සාධක) ඔබ විසින් පරීක්ෂා කර නෙමැති බවය. මෙම ලේඛකයා අප හා සම්බන්ධව මින් පෙරද කීප වතාවකදීම වැරදි සහගත කරුණු සමාජ ගත කර ඇති බව ඔබ ද නොදන්නවා විය නොහැකිය. මේ සියලු කරුණු සළකා බලා මෙබඳු ලේඛකයන් කිසිදු වගකීමක් නොගෙන සියලු මිනිසුන්ට කරන අසාධාරණ අපහාස වෙනුවෙන් පෙනී සිටිමින් ඔබගේ ඉල්ලීම පරිදි මෙම ලිපිය ඔබ වෙත යොමු කරමු. එමෙන්ම ඔහු ගැන කීමට යම්තාක් දුරකට අපි ඔහුගේම බස භාවිතා කරමු.
ආතක් පාතක් නැති ඝන්ධබ්බ ජීවිත ගත කරන අයට අද කාලයේ කොල්ලෝ කියන්නේ කබ්බෝ කියා ය. උන් කරන අමන වැඩ අනුමත කිරීම හඳුන්වන්නේ "කබ්බෝ ෆෝම් කරනවා" කියා ය. මේ උපහැරණය පැරණි දේ අගයන අප වැනි අය කියන්නෙන් වෙනත් විදිහකට ය. එනම් "දෙවියෝ පය නොතබන තැන් වල මෝඩයෝ පිනුම් ගසනවා" යනුවෙනි.

පත්තර පිටු පසුපස ඇති කිසිවෙකුගේ නෙත නොගැටෙන කාලය, මුදල්, දහඩිය, මහන්සිය, වෙහෙස, කැපකිරීම් ගැන දන්නේ ඒවා කරන අය ය. ඒ නිසාම සැබෑ පත්තර කලාව ගැන කැක්කුමක් ඇති අය හැම පිටුවකටම මතු නොව ඒ මත ලියවෙන හැම අකුරකටම අගයක් දෙති. තම තමන්ගේ පෞද්ගලික කෝන්තර සාධාරණීකරණය කර ගැනීමටත්, හොල්මන් චරිත ඔස්සේ සමාජයට සේවයක් කරන තමන් හැර වෙනත් පිරිසක් නැතය යන මතය වක්‍රාකාරයෙන් හෝ සමාජ ගත කරන්නට පත්තර පිටු යොදා නොගනිති. සමාජය කොටවන්නට, බිඳවන්නට, විසුරුවන්නට හෝ වැරදි මත ජනගත කරන්නට පත්තර පිටු යොදා ගැනීම සැබෑ පුවත්පත් කලාවේදීන්ට අනුව පත්තර පිටු මත පැහැරීමකි. තමන් කවුදැයි හෙළි නොකර මේසා විසාල වටිනාකමක් ඇති පත්තර පිටු මත පහරන අයව අප විසින් හැඳින්විය යුත්තේ කවර නමකින් ද ? කිසියම් මාධ්‍යක් මෙබදු අයට තම පිටු මත පහරන්නට ඉඩ දෙන්නේ නම් ඉන් පැහැදිලි වන්නේ එකී මාධ්‍ය ඔවුන්ව අනුමත කරන බවය. "මෙහි පළවන්නේ ලේඛකයන්ගේ මතය මිස ංස්කාරකවරුන්ගේ මතය නොවේ" යන්න යම්තාක් දුරකට හෝ අදාල වන්නේ අනන්‍යතාවයක් ඇති ලිපි සම්බන්ධව පමණක් බව ඕනෑම අයෙකුට පැහැදිලි සත්‍යයකි. එසේ නොවන හැම අකුරකම වගකීම සංස්කාරකවරයා සතු බව ඔබට අමුතුවෙන් පැහැදිලි කර දිය යුතු නොවේ යැයි සිතමි. අප ජීවත් වන මෙම සමාජයේ හැඩයත් පැහැයත් ඔප් නංවන්නට උර දෙන්නන් අතර ප්‍රසිද්ධිය, පුද්ගලික ලාභාපේක්ෂාවන් තුට්ටුවකටත් මායිම් නොකරන්නෝ ද වෙති. ඒ අතර කලාකරුවන්ගේ පටන් නොයේකුත් සමාජ සංවිධානවල ක්‍රියාකාරීහු දක්වා සියලු දෙනාම ප්‍රමාණාත්මක කාර්ය භාරයක් ඉටු කරති. ඔවුන් සියල්ලෝම සම්භාව්‍ය නිර්මාණ හෝ අද්විතීය සේවා නොකරන්නෝ විය හැකිය. නමුත් අන්වර්ථ නමකට මුවා වී වැඩක් කරන කවර හෝ කෙනෙකුට අභූත, පදනම් විරහිත චෝදනා සහ අපවාද නගන්නට මෙබදු "කබ්බන්ට" ඇති සදාචාරාත්මක අයිතිය කුමක් ද ? ඒ සියල්ලටම වඩා හාස්‍යජනක වන්නේ වංගුවකට මුවා වී මිනිසුන්ට අභියෝග කිරීමත්, උපදෙස් දීමත් ය. මෙය කෙතරම් විහිළුවක්ද යන්න ඔබ වැනි ජ්‍යෙෂ්ඨ සංස්කාරකවරයෙකුට නොපෙනීම ඊටත් වඩා පුදුම සහගත ය.
මොහුගේ පක්ෂපාතිත්වය සහ විශේෂයෙන්ම අභූත චෝදනා එල්ල වන අය දෙස බැලූ විට ඔහු කවුරුන්ව නියෝජනය කරන්නේද යන කාරණය අපහැදිලි නොවේ. එමෙන්ම පසුගිය කාලය පුරාවටම ඔබ විසින් ආරක්ෂා කරන්නට උත්සාහ ගන්නා මෙම "හොල්මන් ලේඛකයා" නිසා කොපමණ පිරිසක් ඔබ කෙරෙහි විරසක වූවාද යන්න අපට වඩා හොඳින්ම දන්නේ ද ඔබම ය. මෙබදු ලේඛකයන් නිසා මින් පෙරද ඔබ අපහසුතාවයට පත් අවස්ථා කොතෙක්දැයි අප ඔබට පහදා දිය යුතු නැත.

විචාරය යන වචනයට මුවාවී මිනිසුන්ට අපහාස කිරීමට අවස්ථාව ලබාදී ඒ වෙනුවෙන් සුදුසු පියවර ගැනීමට අගතියට පත් පාර්ශවයක් කටයුතු කිරීම "කුහකකම" නොව ඔවුන් සතු "අයිතිය" බව ඔබ නොදන්නවා විය නොහැකිය.

වචන තරම් මිනිසුන්ව විනාශ කළ හැකි අන් කිසිම දෙයක් නැති බව අප ඔබට පැහැදිලි කළ යුතු නැත. වචන නිසා ඔබ කෙතරම් මානසිකව වැටුණු අවස්ථා ඇද්ද යන්න අපට ඔබගේ මුහුණු පොතේ ගිණුමෙන් තේරුම් ගැනීමට බැරි කමක් නැත. එසේනම් ඔබේ චූටි මල්ලී නිතර මිනිසුන් අමතන "කුහකයා" බඳු වචන නිසා කොහේ හෝ ජීවත් වන අහිංසක මිනිසෙකුගේ හදවතට දුකක්, නෙතට කඳුළක් නැගේ නම් අපි එම මිනිසුන්ගේ දුක්ඛ දෝමනස්සයන් වෙනුවෙන් පෙනී සිටින්නට තීරණය කළෙමු. ඔබ අපට දුරකථනයෙන් පැවසූයේ මෙම සටහන "අප ගැන විය නොහැකි බැවින්" මා විසින් එම " තොප්පිය දා නොගත යුතු" බවත් ය. එම සටහනට අදාල පැහැදිලි සාක්ෂි ඇති නිසා කැමැත්තෙන්ම අසාධාරණයට ලක් වූ සියළු දෙනා වෙනුවෙන් එම තොප්පිය දා ගැනීමට අපි තීරණය කළෙමු. කබ්බෝ ෆෝම් කිරීම එකකි. නමුත් ඔවුන්ව සංස්කරණය නොකිරීමෙන්
සිදුවන්නේ අප බොහෝ දෙනෙකුට ගුරුවරයෙකු බඳු ඔබ
වැනි ජ්‍යෙෂ්ඨ සංස්කාරකවරයෙකුගේ ගිණුම, එළිපිට පෙනී සිටීමට කශේරුකාවක් නැති කබ්බන්ගේ වැඩ වලින් පිරී යාමය. අවසාන වශයෙන් සිදුවන්නේ හැංගි හැංගී අභියෝග කරන කබ්බන්ගේ පුස් වෙඩිලි වල අයිතිකාරයා බවට පත්වන්නට ඔබටම සිදුවීම ය.

කොටින්ම මෙබඳු කබ්බන් ළංකර ගැනීමෙන් කොහේවත් යන කැළෑ පත්තරයක් වුවද ඔබගේ ගිණුමට නොවැටෙතැයි කාට නම් කිව හැකි ද?

අවසාන වශයෙන් කිව යුත්තේ කුලප්පු වූ හරක් අයිතිකරුවන් විසින් බැද දැමිය යුතුව ඇති බවය. ඒ එසේ නොවීමෙන් එය වෙනත් ආකාරයකින් වුවද සිදුවිය හැකි නිසා ය.

**සාමන්ත තැන්නගේ**
කැඩපත සංස්කාරක

**අදාල ලිපිය සම්බන්ධයෙන් සාමන්ත තැන්නගේ මහතාට යම් සිත් රිදීමක් සිදුවූවා නම් ඒ පිළිබඳව අපේ බලවත් කණගාටුව ප්‍රකාශකර සිටිමු. කිසිම ආකාරයකින් කිසිවකුගේ සිත රිදවීමෙ අරමුණක් සන්නසට නැත.**

**සංස්කාරකවරු**
**සන්නස**




Cartoon By Shanika Somatilake

